සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව மேல் மாகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / juk; / Grade: 10 | විෂයය / ghlk; / Subject: ඉතිහාසය | පත්‍රය / tpdhj;jhs; / Paper: I,II |

## ඉතිහාසය I

| | | | |
|---|---|---|---|
| (1) 1 | (11) 1 | (21) 3 | (31) 3 |
| (2) 3 | (12) 1 | (22) 1 | (32) 1 |
| (3) 4 | (13) 3 | (23) 4 | (33) 2 |
| (4) 2 | (14) 4 | (24) 4 | (34) 4 |
| (5) 1 | (15) 2 | (25) 1 | (35) 4 |
| (6) 4 | (16) 1 | (26) 3 | (36) 3 |
| (7) 3 | (17) 2 | (27) 4 | (37) 3 |
| (8) 2 | (18) 2 | (28) 2 | (38) 2 |
| (9) 3 | (19) 1 | (29) 4 | (39) 1 |
| (10) 3 | (20) 4 | (30) 4 | (40) 1 |

## ඉතිහාසය II

(01) (අ) (i), (ii) සිතියමෙහි දක්වා ඇත. (ලකුණු 18)

(ආ) (i) A. ඉබන් බතුතා C. දෙවන පරාක්‍රමබාහු
B. වස්කෝ ද ගාමා D. බුද්ධඝෝෂ හිමි (ලකුණු 04)

(ii) 1. මාලයක් 2. ඉබ්බන්කටුව සුසාන භූමිය
3. පූර්ව ඓතිහාසික යුගය 4. ප්‍රභූන්ගේ ජීවිතයේ සුඛිත මුදිත ස්වරූපය/ ආභරණ පැළඳීම/ විදේශ සබඳතා (ලකුණු 04)

(iii) 1. සීගිරිය 2. අනුරාධපුර
3. පළමුවන කාශ්‍යප/ සීගිරි කාශ්‍යප 4. විජ්ජුලතා, මේඝලතා, (විදුලිය, වැසි වලාකුළු) (ලකුණු 04)

(02) (i) මිනිහාගල්කන්ද, බුන්දල, පතිරජෙවෙල, අලුගල්ගේ, මාතොට (ලකුණු 03)

(ii) වල්දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටු අල, කිතුල් ඇට, දෝතලු ඇටවල මද (ලකුණු 04)

(iii) රාවණා ඇල්ල ලෙන, පාහියන්ගල, කුරුවිට බටදොඹ ලෙන යන ස්ථානවලින් දෙකක් නම් කිරීම හා පහත කරුණු විස්තර කිරීම

- දෙකට බෙදෙන සේ මිනිස් හිස් කබල්වල සිදුරු විද තිබීම
- හිස් කබලේ රළුවට ඇති දාර සහ පිටතට නොරා ඇති කොටස් ගලක උලා මට්ටම් කර ඇත.
- හිස් කබල්වල රතු ගුරුගල් ආලේප කර ඇත.
- ඇටසැකිලි නමා වකුටුකර වළලා තිබීම (ලකුණු 05)

(iv) ◆ රංචාමඩම. හල්දුම්මුල්ල බෙරගල සුසාන භූමිවලින් හමුවූ සාධක (මැටිධරු සුසාන)

◆ ශිලා මංජුසා සොහොන්

◆ උඩරංචා මඩම නිවාසයෙන් වළං කටු රාශියක් හමුවීම හා පින්තාරු කළ මැටි බඳුනක කොටස් හමුවීම, හප්ලුම්මුල්ලෙන් ද වළඳක කොටස් හමුවීම

◆ සකපෝරුව භාවිතා කර වළං තැනීම / කාල රක්ත වර්ණ මැටි බඳුන් තැනීම ආදී කරුණු විස්තර කිරීම. (ලකුණු 06)

(03) (i) A - පළමුවන කාශ්‍යප

B - නිශ්ශංකමල්ල

C - කුටකණ්ණ අභය (ලකුණු 03)

(ii) ◆ රට ආර්ථික වශයෙන් දියුණු වීම

◆ රට වැසියාට ආරක්ෂාව සැපයීම

◆ රට වැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ගොඩ නැගිම (ලකුණු 04)

(iii) පියාගෙන් පුතාට, සහෝදරයාගෙන් සහෝදරයාට රජකම උරුම වීම උදාහරණ සහිතව විස්තර කිරීම, උඩරට රාජධානියේ රජුට පුතෙකු නොසිටි විට අගබිසවගේ සහෝදරයාට රජකම උරුම වීමේ සම්ප්‍රදාය ද ලියා තිබීම නිවැරදි ය. (ලකුණු 05)

(iv) ◆ මාතොට අන්තර්ජාතික වරාය එළාර නම් පාලකයාගේ අණසකින් මුදවා ගැනීම

◆ කාවන්තිස්ස පිය රජුගේ අවවාද අනුශාසනා අනුව කටයුතු කිරිම

◆ විම්‍යගතව පැවති දේශපාලන බලය වඩාත් ශක්තිමත් පදනමක සංවිධානය කිරීම

◆ ජනතාව වෙත සහනශීලී ප්‍රතිපත්ති ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම

◆ වෙහෙර විහාර ගොඩනැංවීම (ලකුණු 06)

(04) (i) A. බුත්සරණ B. උම්මග්ග ජාතකය C. සෙල්ලිපි (ලකුණු 03)

(ii) ◆ වෙළඳපොළට පැමිණෙන කරත්තවලින් මිස එය පසුකරගෙන යන කරත්තවලින් බදු අයකර නොගැනීම.

◆ හිරු එළියෙන් ආවරණය වන පරිදි මඩුවක් යට පමණක් බුලත් වෙළඳාම් කළ යුතු වීම

◆ පොහොය දිනවල වෙළඳාම් කරන්නන්ගෙන් බදු අය කිරිම ( මහියංගන විහාරයේ පහන් දැල්වීමට තෙල් ලබාදිය යුතු වීම)

◆ රජය විසින් අනුමත නොකල තරාදි පඩි කිරුම් මිනුම් සඳහා භාවිතය තහනම් කිරීම (ලකුණු 04)

(iii) ◆ ලෝහ කර්මාන්තය, තඹ කර්මාන්තය, රන් කර්මාන්තය, ඇත්දත් කර්මාන්තය, මැටි කර්මාන්තය, රෙදි විවීමේ කර්මාන්තය පිළිබඳ කරුනු දෙකක් උදාහරණ සිහිතව විත්කර කර තිබීම (ලකුණු 05)

(iv) ◆ පළමුවන ගජබාහු රජු පත්තිනි දේවාලයක් විවෘත කිරීම සඳහා චේර රාජ්‍යයට ගිය බව එරට සෙල්ලිපියක සඳහන් වීම

◆ භාතිකාභය රජතුමා රෝමයට තානාපතිවරු පිටත්කළ බව මහාවංශයේ සඳහන් වීම.

◆ හයවන අග්ගබෝධි රජුගේ කාලයේ විසිවතාවක් චීනයට රාජ්‍ය ත්‍රින්ත්‍රික දූත ගමනක් යෙදුනු බව.

◆ පළමුවන විජයබාහු රජතුමා පාණ්ඩ්‍ය දේශය හා කාලිංස දේශය සමග ඥාති සබඳතා ගොඩ නගා ගැනීම

◆ බුරුම දේශයෙන් (මෙම රජතුමා) උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීම (ලකුණු 06)

(05) (i) A මහසෙන් B ධාතුසේන C දෙවන මුගලන් (ලකුණු 03)

ii. A කෙටුකනබ අය, කැති අඩ B මතරමජබක

C දකපති D බොජකපති (ලකුණු 04)

iii. ◆ ආලාහන පිරිවෙන් සංකීර්ණයෙන් හමුවූ සාධක (ශල්‍යවෛද්‍ය උපකරණ)

◆ මිහින්තලේ හමුවූ සාධක (බෙහෙත් ඔරු)

◆ රජවරු අනුග්‍රහ දැක්වීම ( බුද්ධදාස රජතුමා, පස්වන මහින්ද රජතුමා, හතරවන කාශ්‍යප රජතුමා, පළමුවන උපතිස්ස රජතුමා,

◆ පැරණි වෛදපොත් හමුවීම, පැරණි විෂ වෙදකම පැවතීම

නිදසුන් දෙකක් සහිතව විස්තර කිරීම (ලකුණු 05)

(iv) ◆ වැව් හා බැඳුණු තාක්ෂණය (වැවක ප්‍රධාන අංගවලින් ඉටුවූ කාර්යය)

◆ ඇළ මාර්ග තැනීම (යෝධ ඇළ, ඇළහැර ඇල, මිනිපේ ඇළ)

◆ සීගිරියේ ජල උද්‍යාන පිළිබඳ විස්තර කිරිම

◆ උමං ජල මාර්ග පැවතීම

අවස්ථා තුනක් පිළිබඳ විස්තර කිරීම (ලකුණු 06)

(06) (i) A සුභ සෙනෙවි B බුවනෙකබාහු ආදිපාදවරයා C. සංඛ සෙනෙවි (ලකුණු 03)

(ii) ◆ සතුරු ආක්‍රමණ ◆ මධ්‍යගත පාලනය බිඳ වැටීම

◆ ආරක්ෂාව නැති වීම ◆ වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම

◆ ආර්ථික පරිහාණිය ◆ ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම

මින් කරුණු 2ක් ලිවීම (ලකුණු 04)

(iii) ◆ වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කිරිම

◆ සපුමල් කුමරු යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම

◆ ජෝතිය සිටුවරයාගේ කැරැල්ල මැඩ පැවැත්වීම

◆ කෝට්ටේ රාජධානිය යටතේ රට එක්සත් කොට ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම

◆ පැපිලියාගේ සුනේත්‍රා දේවි පිරිවෙන ඉදිකිරීම් හා සාහිත්‍ය පොත්පත් ලිවීමට අනුග්‍රහය දැක්වීම

ඉහත කරුණු දෙකක් විස්තර කිරිමට (ලකුණු 05)

(iv) ◆ අහස් දියෙන් වගාකිරීමට යොමුවීම

◆ ප්‍රධාන වගාව වී වගාවට අමතරව ජලය හිඟ ප්‍රදේශවල හේන් ගොවිතැන් කිරිම

◆ ක්‍රම ක්‍රමයෙන් වාණිජ ආර්ථික රටාවකට නැඹුරු වීම

◆ අතිරික්තය වෙළඳාමට යොමුවීම

◆ කුළුබඩු මුතු මැණික් ඇතුන් ඇත්දළ වැනි වෙළඳ භාණ්ඩ අපනයනයට යොමුවීම

මින් කරුණු 3ක් පැහැදිලි කිරීම (ලකුණු 06)

(07) (i) ◆ වැදගත් නායකයන් සම්බන්ධ නඩු ◆ කැරලි කෝලාහල පිළිබඳ නඩු

◆ රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු ◆ කුමන්ත්‍රණ නඩු

◆ විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

මින් තුනක් නම් කිරීම (ලකුණු 03)

(ii) ගබඩාගම්, නින්දගම්, විහාරගම්, දේවාලගම් (ලකුණු 04)

(iii) ◆ ස්වයංපෝෂිත ආර්ථික රටාවක් වීම ◆ කඳුකර ප්‍රදේශවල වී ගොවිතැන

◆ හෙල්මළු ක්‍රමයට වගාකර තිබීම ◆ ධාන්‍ය, අල, බතල වගා කිරීම

- ගෙවතු ආශ්‍රිතව කොස් දෙල් එළවළු පලතුරු කුළුබඩු ආදිය වගා කිරීම
- යකඩ. දැව, ලාක්ෂා, පන් ආදී කර්මාන්ත පැවතීම
- සත්ත්ව පාලනය
  ඉහත කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කිරීම (ලකුණු 05)

(iv)
- උඩරට ජනතාව හැමවිටම රජුට සහාය දීම
- පෘතුගීසීන් වෙනුවෙන් සටනට ගිය දේශීය හමුදාව උඩරට රජුගේ හමුදාවට එක්වීම
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම රජවරුන්ගේ උපාය කෞශල්‍ය
- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීමෙන් ලද ආරක්ෂාව
  මින් හේතු තුනක් විස්තර කිරීම (ලකුණු 06)

(08) (i) ඩාන්ටේ, පෙට්‍රාක්, බොකැෂියෝ, තෝමස් මුවර්, ප්‍රැන්සින් බේකන්, විලියම් ෂේක්ස්පියර්, ඉරාස්මස් මින් තිදෙනෙකු නම් කිරීම. (ලකුණු 03)

(ii)
- මොනාලිසා, අන්තිම භෝජන සංග්‍රහය, අවසාන විනිශ්චය, සිස්ටයින් දෙව්මැදුරේ සිතුවම්, ආදම්ගේ චිත්‍රය මින් දෙකක් ලිවීම.
- ලොරෙන්සෝ මෙඩිසිගේ ප්‍රතිමාව, පියෙටා ප්‍රතිමාව, ටෝසෙස්ගේ ප්‍රතිමාව, දාවිත්ගේ ප්‍රතිමාව, ඩේවිම්ගේ ප්‍රතිමාව ආදී ප්‍රතිමාවලින් දෙකක් ලිවීමට (ලකුණු 04)

(iii)
- කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන්ට යටත් වීම
- වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම
- බුද්ධි ප්‍රබෝධය
- පල්ලියේ ආධිපත්‍යය විවේචනය කිරීම
  (හේතු 3ක් සඳහන් කිරීමට ලකුණු 03යි. මින් එක් කරුණක් විස්තර කිරීමට ලකුණු 02) (ලකුණු 05)


(iv)
- ජාතික රාජ්‍ය බිහිවීම, මධ්‍යම පන්තියක් බිහිවීම
- ස්වයංපෝෂිත ආර්ථික රටාව පරිහානියට පත්වීම, ජාතික වෙළඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම, නව මුහුදු මාර්ග හා රටවල් සොයා යාම, මුදල් භාවිතය, බැංකු ක්‍රමය ක්‍රියාත්මක වීම, මින් කරුණු දෙකක් විස්තර කිරීම (ලකුණු 06)


(09) (i) A ක්‍රිස්ටෝපර් කොළොම්බස් B. පර්ඩිනන්ඩ් මැගලන් C. කැබේ සහෝදරයෝ (ලකුණු 03)

(ii) A මුද්‍රණ යන්ත්‍රය B. දුර දක්නය
C. ග්‍රහලෝක ඉලිප්සාකාරව ගමන් කිරීම D. ගුරුත්වාකර්ෂණ නියමය (ලකුණු 04)

(iii)
- ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම
- මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම
- ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම
- ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහය දැක්වීම
  මින් සාධක දෙකක් කෙටියෙන් විස්තර කිරීම (ලකුණු 05)

(iv) දේශපාලන වෙනස්කම්
- යටත් විජිත බවට පත්වීමෙන් පසු රාජාණ්ඩු පාලන ක්‍රමය අවසන් වීම හා පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් කරා යොමුවීම
- සාම්ප්‍රදායික නිලධාරී පන්තිය වෙනුවට නව නිලධාරී පන්තියක් හා නව පරිපාලන ආයතන බිහිවීම
- පැරණි නීති රීති වෙනුවට රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම
  ආර්ථික වෙනස්කම්
- ස්වයංපෝෂිත ආර්ථික රටව බිඳවැටීම හා ආනයන අපනයන ආර්ථික රටාවකට (වැවිලි ආර්ථිකය) යොමුවීම
- මුදල් භාවිතය ප්‍රචලිත වීම දුම්රිය මාර්ග මහා මාර්ග පද්ධති හා ප්‍රවාහන සේවා දියුණු වීම
- වෙළෙඳ නගර බිහිවීම හා මුදල් උපයාගත් මධ්‍යම පන්තියක් බිහිවීම
  ඉහත කරුණු දෙකක් විස්තර කිරීම (ලකුණු 06)


N
යාපනය
යෝධවැව
අනුරාධපුරය
ලංකාපට්ටන
පරාක්‍රම සමුද්‍රය
යාපහුව
මහනුවර
මාගම
දෙවුන්දර


බ්‍රිතාන්‍ය
පෘතුගාලය
ඉතාලිය
ගෝව
රතුමුහුද
මලය
අර්ධද්වීපය